# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2007

### බෞද්ධ දර්ශනය -BUPH-E1025

### මූලාශ්‍රය අධ්‍යයනය හා ආදි බෞද්ධ නිකාය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. පඤ්ච නීවරණ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සාමඤ්ඤ ඵල සූත්‍රාගත උපමාවන්ද ඇසුරුකොට ගනිමින් ධර්මානුකූලව විවරණය කරන්න.

02. මහා නිදාන සූත්‍රය පාදක කොට ගනිමින් සමාජය තුළ කලි කළහ ජනිතවීමට අදාළ හේතුඵල න්‍යාය විමසුමට ලක්කරන්න.

03. ඉන්ද්‍රිය ඥානයේ ප්‍රභවය හා කාර්ය සංසිද්ධිය මධුපිණ්ඩික සූත්‍රය ඇසුරින් සනිදර්ශනව පෙන්වා දෙන්න.

04. ශාස්වත හා උච්ඡේද දෘෂ්ටි වෙන වෙනම හඳුන්වා දෙමින් එකී දෘෂ්ටිවාදයන් පිළිබඳ බෞද්ධ ආකල්පය පරීක්ෂා කරන්න.

05. හේතු ඵල සම්බන්ධය පිළිබඳ බුද්ධකාලීන ස්ථාවරයන් කවරේදැයි අචෙල කස්සප සූත්‍රය ඇසුරින් සාකච්ඡා කරන්න.

06. ''නිකායාන්තර මතභේදවලට පසුබිම සකස්වූයේ ජ්‍යෂ්ඨ භික්ෂූන් හා උන්වහන්සේලා සමග එකඟ නොවූ භික්ෂූන් අතර උපන් මතභේද ඔස්සේය.'' විමසන්න.

07. මහා සංඝික ලෝකෝත්තරවාදය හඳුන්වා දෙමින් එය පසුකාලීනව බුදුසමය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

08. සර්වාස්තිවාදීන්ගේ සර්වම් අස්ති වාදය හා පුද්ගල නිෂේධනය ආදි බුදුදහම සමග නොගැලපේයැයි සැළකෙනුයේ කවර කරුණු අනුවදැයි විභාග කරන්න.

09. සම්මිතියයන් හා වාත්සීපුත්‍රියයන් විසින් පුද්ගලවාදය තහවුරු කරනු පිණිස දක්වන ලද කරුණු මොනවාදැයි පෙන්වා දෙන්න.

10. පහත දැක්වෙන මාතෘකාවලින් <u>දෙකකට</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.

1. ෂඩ් අභිඥා
2. බෞද්ධ අනාත්ම චින්තාව
3. ක්ෂණවාදය
4. ථෙරවාද නාමය

**************************